# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 905/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 29/05/2024<br>පැය 1415 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. 2024.05.28 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 15 | - | තඹ දඟර 01<br>යකඩ බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. කේරළ ගංජා සමඟ සහ අයිස් මත්ද්‍රව්‍ය සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.05.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කටාන පොලිස් වසමේ කිඹුලාපිටිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **කේරළ ගංජා ග්‍රෑම් 91 ක්, අයිස් මත්ද්‍රව්‍ය 03 මිලි ග්‍රෑම් 700 ක්** හා එම ජාවාරමෙන් උපයා ගන්නා බවය සැකකරන **මුදල් රුපියල් 120,000/- ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කටාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වූ දංකොටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කටාන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි කැණීම් කර පටවමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර**

2024.05.28 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලංගවිල කඳවුර නිලධාරීන් කණ්ඩායමක් විසින් අරලගංවිල පොලිස් වසමේ ගෝමතියාය වැටලීමක් සිදු කර **බලපත්‍ර උල්ලංඝණය කරමින් වැලි කැණීම් කර වැලි පටවමින් සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන අරලගංවිල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන අවුරුදු 28 හා 45 වයස් වල පසුවන දිවුල්දමන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. අරලගංවිල** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි කැණීම් කර පටවමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර**

2024.05.28 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අරලගංවිල පොලිස් වසමේ ගෝමතියාය ප්‍රදේශයේදී වැටලීමක් සිදු බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි කැණීම් කර පටවමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන අරලංගවිල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32,36 හා 51 වයස් වල පසුවන පිඹුරත්තෑව , දේවගල හා අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. අරලගංවිල** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර**

2024.05.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රත්ගම පොලිස් වසමේ ජනපදය ප්‍රදේශයේදී වැටලීමක් සිදු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 370 ක් අත්අඩංගුවට ගෙන රත්ගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වූ රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** රත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**06. තල්මසුන්ගේ ශරීර කොටසක් වන මස් අම්බර් ජාවාරම් සිදු කරන ලද සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර**

2024.05.28 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කල්පිටිය පොලිස් වසමේ කුරුඤ්ඤන්පිටිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු තල්මසුන්ගේ ශරීර කොටසක් වන මස් අම්බර් කිලෝ ග්‍රෑම් 23 ක් සමඟ අත්අඩංගුවට ගෙන කරුවලගස්වැව වන ජීවි කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන අවුරුදු 34 හා 40 ක් වූ කල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**07. බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයක් මගින් වැලි කැණීම් කර පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.05.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සේරුනුවර පොලිස් වසමේ තීතන්තෙට්ටි ප්‍රදේශයේදී වැටලීම් 02ක් සිදුකර සිදු මහවැලි ගඟට හානි වන පරිදි ගඟ තුළට ට්‍රැක්ටර් රථයක් ඇතුළු කර වැලි කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු සේරු නුවර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 24 වයස් වල පසුවන මුතූර් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** සේරු නුවර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**